## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2015

---

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම, කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා(4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම් රු.1,756,148 ක් ලැබිය යුතු පොළී ආදායම් ගිණුමට හර කිරීම වෙනුවට ආයෝජන ගිණුමට හර කිරීම හේතුවෙන් ලැබිය යුතු පොළී ආදායම් හා ආයෝජන වටිනාකම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 නොසැසඳුනු ගිණුම්

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මතු දැක්වෙන ගිණුම් ශේෂ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් ශේෂ සමඟ සැසඳීමේදී පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ ගිණුම් අනුව | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් අනුව | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් අනුව | වෙනස |
|---|---|---|---|---|
| | රු. | රු. | | රු. |
| (අ) ණයගැතියෝ | 7,944,793 | 6,512,810 | - | 1,431,983 |
| (ආ)ණයහිමියෝ | 983,872 | 5,059,699 | - | 4,075,827 |
| (ඇ)ණයගැතියෝ | 3,841,016 | - | ශේෂයක් දක්වා නොමැත. | 3,841,016 |

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) අවසන් තොගය | 2,327,707 | (i) විස්තරාත්මක උපලේඛන<br>(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා |

| | | | |
|---|---|---|---|
| (ආ) ලැබිය යුතු ගිණුම් | | | |
| (i) | වෙළඳ ණයගැතියෝ | 16,103,023 | ශේෂ සනාථ කිරීම |
| (ii) | විවිධ ණයගැතියෝ හා ලැබිය යුතු තැන්පතු | 6,744,480 | |
| (iii) | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් | 7,944,793 | |
| (ඇ) | ස්ථාවර වත්කම් (2008 වර්ෂයේ ආරම්භක ශේෂය) | 129,897,122 | ශේෂය සැදුම්ලත් ආකාරය දැක්වෙන විස්තරාත්මක වාර්තා |
| (ඇ) | සංවර්ධන පිරිවැය | 1,788,459 | විස්තරාත්මක උපලේඛනය |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් 2012 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබූ රු.5,396,779 ක් සහ වසරකට වැඩි රු.2,238,717 ක් හඳුනාගෙන තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙළඳ ණයගැතියන් යටතේ දක්වා තිබූ ශේෂ වලින් රු.1,662,788 ක් වර්ෂ 03 කට වැඩි කාලයක්ද රු.12,206,640 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක්ද රු.3,527,025 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත ශේෂවලින් සමන්විතව තිබුණි.

(ඇ) ලැබිය යුතු ගිණුම් හා ලැබිය යුතු තැන්පතු යටතේ දක්වා තිබූ ශේෂවලින් රු.7,114,279 ක් වර්ෂ 03 කට වැඩි කාලයක්ද, රු.3,616,980 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක්ද, රු.1,410,000 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත හිඟ හිටි ශේෂවලින් සමන්විතව තිබුණි.

(ඇ) උපචිත වියදම් යටතේ දක්වා තිබූ ශේෂවලින් රු.1,653,760 ක් වර්ෂ 02 කට වැඩි කාලයක්ද රු.11,649,560 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 02 කට අඩු කාලයක්ද, රු.19,424,716 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත ගෙවිය යුතු ශේෂ වලින් සමන්විත වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 සංචාරක හෝටල් ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 02 වගන්තිය. | සංචාරක හෝටලයක් පවත්වාගෙන යාමේ දී ව්‍යාපාරය ලියාපදිංචි කර ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුතු වුවද ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන සමුද්‍රා හෝටලය ලියාපදිංචි කර නොතිබුණු අතර බලපත්‍ර ලබාගෙනද නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 වගන්තිය | කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණය, තොග කාල විශ්ලේෂණය සහ පැරණි, යල් පැනගිය හා සෙමින් චලනය වන තොග සහ වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතන චක්‍රලේඛ අංක 08 | (i) වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචිය සිදුකර නොතිබුණි.<br>(ii) මිල විවෘත කිරීම් අවස්ථා සඳහා මිල කැඳවුම් වලට ප්‍රතිචාර දැක්වූ සැපයුම්කරුවන්/ නියෝජිතයින් සහභාගී කරවා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.110,385,385 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.146,281,118 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 35,895,733 ක පිරිහීමක් දැක්වුණි. සංචාරක සංවර්ධන බදු ආදායම රු.10,966,361 කින් සහ අපගමන බදු ආදායම රු.17,852,995 කින් වැඩිවුවද වැටුප් වේතන හා සේවක පාරිශ්‍රමික රු.49,536,675 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට මූලික හේතුව වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 සහ 2012 වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණද 2013 සහ 2014 වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබිණි. 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සියයට 24.5 ක් විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.166,366,966 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණු අතර එය 2015 වර්ෂයේදී රු.310,384,960 ක් විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ආදායම රු.මිලියන 441.7ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 425.7 සමඟ සැසඳීමේදී සියයට 3.7 ක වර්ධනයක් විය. එසේම ඉකුත් වර්ෂයේදී ඉගැන්වීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 279 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු. මිලියන 331ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 18.6 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු අතර, එම පරිච්ඡේදයේ (ඇ) උපවගන්තිය අනුව අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan) ක්‍රියාත්මක කාල රාමුව (Time line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇතුලත් විය යුතුය. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් ඉහත පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ අතර සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අදාලව කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. එබැවින් ආයතනයේ කාර්යසාධනය ඇගයීමේ ඵලදායී පාලන කාරකයක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම යොදාගත නොහැකි බව නිරීක්ෂණය විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් ආයතනයට ජාතික වෘත්තීය සුදුසුකම (NVQ), ලබාගැනීම සඳහා උපදේශකත්වය හා සහායන් ලබා දුන්නද ආයතනය මේ දක්වා ජාතික වෘත්තීය සුදුසුකම සහිතව සහතිකපත් නිකුත් කර නොතිබුණි.

(ආ) ආයතනය පවත්වන සිව් අවුරුදු කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා පූර්ණ උපාධියක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි නොකිරීම නිසා පාලනයකින් තොරව විවෘත වෙළඳපලින් ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට හා එහි පවත්වාගෙන යනු ලබන සමුද්‍රා හෝටලයට ආහාරමය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට මාස තුනක පමණ කාලයක් සඳහා රු.4,205,537 ක වියදමක් දරා තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) බණ්ඩාරවෙල හෝටල් පාසැල් කළමනාකාරීත්වය විසින් රජයේ ටෙන්ඩර් පරිපාටිය අනුව නව සැපයුම්කරුවන් තෝරා ගැනීමේ ක්‍රමවේදය අනුගමනය නොකරමින් 2015 මාර්තු මස සිට 2015 සැප්තැම්බර් 30 දක්වා විවෘත වෙළඳපල මිල ගණන් මත හෝටල් පාසැල සඳහා අවශ්‍ය රු.1,066,755 ක ආහාරමය අමුද්‍රව්‍ය ලබාගෙන තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කලමනාකරණ ආයතනයට අයත් ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය විගණිත දිනය වූ 2018 දෙසැම්බර් 26 දින දක්වා නිරාකරණය කර ගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන සමුද්‍රා හෝටලයේ වර්ෂය තුළ ආදායම් ලබාගැනීම සඳහා හෝටල් කාමර රාත්‍රී (Room Nights) 4745 ක් පවතින අතර එයින් ආයතනයට ලඟාකර ගත හැකි වූයේ හෝටල් කාමර රාත්‍රී 1446 ක් හෙවත් සියයට 30 ක් පමණි.

## 4.4 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුළ කුලී පදනම මත ලබා ගත් වාහන සඳහා දරන පිරිවැය සහ කුලියට ගත් වාහන ධාවනය කළ දුර පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.5 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.662,200ක් වටිනා තේක්ක ඇඳි රහිත පුටු 52 ප්‍රයෝජනයකට නොගෙන භෝජනාගාරයේ එළිමහන් ප්‍රදේශයක අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණි.

(ආ) හෝටල් පාසලේ 7 වන මහලේ ඉදිකර තිබූ රු.300,000 ක් වටිනා සමර් හට් 04 ප්‍රයෝජනයකට නොගෙන දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වර්ග අඩි 2172 ක් කිසිදු අයකිරීමකින් තොරව බාහිර ආයතන උපයෝජනය කර තිබුණි.

(ඈ) ආයතනය සතු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණය කළමනාකරණය කර භාවිතයට නොගැනීම නිසා වර්ග අඩි 8547 ක් ආයතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම උපයෝජනය කර නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ නිළධාරීන් මාරු කිරීමේ විධිමත් පරිපාටියක් සකස් කර නොතිබූ අතර කළමණාකරණය විසින් වරින් වර සිදු කරනු ලබන මාරු කිරීම් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය 163 ක් වූ අතර තථ්‍ය කාර්යය මණ්ඩලය 101 ක් විය. අධ්‍යක්ෂ ජෙනරාල්, රෙජිස්ට්‍රාර් සහ අධ්‍යක්ෂ (මූල්‍ය) යන තනතුරු 03 ම සමාලෝචිත වර්ෂය තුළදී පුරප්පාඩුව පැවතුනි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 ඔක්තෝබර් 19 දිනදීය.

**5.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

මුදල් රෙගුලාසි 134 හා 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

-------------------------

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව ආයතනය සඳහා තුන් අවුරුදු ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

සමාලෝචිත වර්ෂයේදී ආදායම් හා වියදම් විෂයයන් 22 ක අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 23 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් 2013 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2018 නොවැම්බර් 30 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.6 නොවිසඳී ඇති විගණන ඡේද**

----------------------------------

2014 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ පහත අඩුපාඩු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් වී නොතිබුණි.

(අ) කොළඹ හෝටල් පාසලේ පන්ති කාමර සඳහා 2013 වර්ෂයේදී රු.2,725,000 ක් වටිනා මේස හා පුටු 200 බැගින් මිලදී ගෙන තිබුණි. එකී මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය පිරිවිතර හා නොසැසඳීම ලෙස දක්වා ප්‍රතික්ෂේප කර තිබුණද මිලදී ගැනීම සිදුකර තිබූ භාණ්ඩද පිරිවිතරයේ සඳහන් නියමයන්ට පටහැනි ඒවා විය.

(ආ) ආයතනයේ හෝටල් පුහුණු පාසලට හෝ එම ආයතනයට අයත් ප්‍රාදේශීය හෝටල් පාසල් වලට අයත් නොවන, පෞද්ගලික හෝටල් පාසලක සිසුන් 54 දෙනෙකුට සහ සංචාරක හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය මැදිහත් වී පවත්වා තිබුණු තරඟවලට අදාල ජයග්‍රාහකයන්ට ප්‍රදානය කිරීම සඳහා කිසිදු පදනමකින් තොරව 2014 වර්ෂයේදී සහතිකපත් 245 ක්ද ඊට පෙර වාර්ෂිකව 900 බැගින් සහතිකපත් නිකුත් කර තිබුණි. සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී එම උපාධිධාරී සංගමය විසින් නිකුත් කරන ලද එක් සහතික පත්‍රයක ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තනතුර වෙනුවට ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු අත්සන් කර තිබුණි.

(ඇ) හෝටල් පාසල සඳහා පරිත්‍යාග වශයෙන් ලැබෙන මත්පැන් වර්ග ගබඩාවට භාර නොදී ආහාරපාන අංශයේ ප්‍රධානියා භාරයේ ලේඛනගත කිරීමකින් තොරව තබා තිබුණි. එම තොග භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි රු.35,000 ක් වටිනා වයින් බෝතල් 12 ක් අස්ථානගත වී, තවත් මත්පැන් බෝතල් 06 ක හිඟයක් නිරීක්ෂණය වූ අතර එකී මත්පැන් ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ද යොදාගත් බවට සාක්ෂි නොතිබුණි.

(ඈ) 2013 අප්‍රේල් මාසයේ සිට 2014 ජුනි 30 දින දක්වා ආයතනයේ කාර්ය මණ්ඩලයට ලොන්ඩ්‍රි සේවා සැපයීම හේතුවෙන් දැරීමට සිදු වූ ඍජු පිරිවැය රු.887,028ක් පමණ විය. මෙම පිරිවැය කාර්යය මණ්ඩලයෙන් අයකර නොතිබුණි.

(ඉ) ආයතනයේ ආහාරපාන අංශයට බඳවා ගත් බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙකුට 2013 වර්ෂයේ මාර්තු මාසයේ සිට 2014 වර්ෂයේ ජුනි මාසය දක්වා පංති වාර්තා පොත් අනුව වැඩ කළ දේශන පැය ප්‍රමාණය ඉක්මවා රු.972,865 ක් ගෙවීම් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) ඉන්වෙන්ට්‍රි පාලනය | ඇතැම් අංශ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන නොපවත්වන අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තාද ඉදිරිපත් කර නොතිබීම. |
| (ඇ) තොග සමීක්ෂණය | ඇතැම් තොග සමීක්ෂණ වාර්තාවල තොග සමීක්ෂණයට සහභාගි වූ නිලධාරීන්ගේ නම් සහ අත්සන් යොදා නොතිබීම, තොග සමීක්ෂණ වාර්තාවලට දත්ත ඇතුළත් කිරීමේදී සිදු කළ සංශෝධන සඳහා වගකිව යුතු නිලධාරියකු කෙටිසන් යොදා නොතිබීම. |
| (ඈ) අයවැය පාලනය | (i) ඇතැම් විෂයන් සඳහා ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුල වියදම් දරා නොතිබීම.<br>(ii) ඇස්තමේන්තු කර නොතිබූ ආදායම් හා වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආදායම් රැස්කර තිබීම හා වියදම් සඳහා වැයකර තිබීම. |